( 21 )

# බුද්ධ දේශනාවේ එන සත්ත්ව උපමාවන් හා සතුන්ගේ ලක්ෂණ

වෙලන්ගහවත්තේ පඤ්ඤාවංස හිමි.
සිව් වන වසර
welangahawatthe@gmail.com

## 01. හැඳින්වීම

ලෝකයේ ජීවත් වන විවිධ සතුන් පිළිබඳ අධ්‍යයන කිරීමේ දී, එම සතුන්ගේ ප්‍රභවය පිළිබඳ පුරාවිද්‍යාඥයන්ගේ අවධානය යොමුව තිබේ. එම සතුන්ගේ නිජ භූමි හා එම සතුන්ගේ පරිණාමය පිළිබඳව විවිධ මත පළ කර තිබේ. සතුන්ගේ මූලික ලක්ෂණ හඳුනාගනිමින්, ඒ සතුන්ගේ ජීවන ක්‍රමවේද පිළිබඳව ද නූතනයේ බොහෝ පර්යේෂකයන් විවිධ තොරතුරු ඉදිරිපත් කර ඇත. වර්තමානයේ මෙම සොයාගන්නා ලද තොරතුරු මීට වසර 2500කට පෙර, ක්‍රි.පූ. 6 සියවසේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබේ. එම කාරණා ලෝක විෂයීය, විශ්වීය කාරණාවන්ගෙන් සැදුම්ලත් විශිෂ්ට දේශනා ලෙස හඳුනාගත හැකි ය.

දේශනා පාලියෙහි සූත්‍ර පිටකයෙහි සූත්‍ර රාශියක් සතුන් උපමාවට ගනිමින් සතුන්ගේ ලක්ෂණීය භාවයන් උපයෝගී කරගනිමින් ශ්‍රාවකයාට ධර්මය දේශනා කර ඇති බව ත්‍රිපිටකය පිරික්සීමේ දී පෙනේ. සිංහ, වඳුරු, සර්ප, හිවල්, ඉඳිබු ආදී සත්ව ලෝකයේ නොයෙක් සතුන්ගේ ජීවන ක්‍රමවේදය, ලක්ෂණ තුළින් විශාල පණිවිඩයක් සමාජගත කිරීමට බුදුරදුන් දේශනා තුළින් සමත් ව ඇත. යථාර්ථය සත්ව උපමාවන්ගෙන් ඉදිරිපත් කිරීමේ කලාව බුදුන් වහන්සේ මැනවින් හඳුනාගෙන තිබුණි.

මෙහි දී බුද්ධ දේශනාවේ එන සතුන් කිහිපදෙනෙකු පිළිබඳ ව අධ්‍යයනය කිරීම සඳහා සූත්‍ර පිටකයේ ඛන්ධක වග්ගය, මහා වග්ගය, සළායතන වග්ගය, නිදාන වග්ගය යන සූත්‍ර භාණ්ඩවලින් තොරතුරු ලබාගත් අතර, මෙම පර්යේෂණය තුළින් සාකච්ඡා කෙරෙනුයේ බුදුරදුන් විසින් දේශිත දහම් කරුණු තුළින් තිරිසන් සතුන් පිළිබඳ ව සිදුකරනු ලැබූ දේශනාවන් පිළිබඳ අධ්‍යයනයකි. මෙහි දී සතුන්ගේ ජීවිත ලක්ෂණ, චර්යා විධි සතුන්ගේ ගති ලක්ෂණ හඳුනා ගැනීම අධ්‍යයනය කරනු ලබයි. බුදු ඇසින් දුටු මෙම සතුන්ගේ චර්යා විධි උපමාවට යොදා ගනිමින් බුදුරදුන් විසින් මානව සත්වයාට ජීවිත යථාර්ථය අවබෝධ කර දුන් ආකාරය පිළිබඳ ව අධ්‍යයනයක් කිරීම මෙහි අරමුණ වේ.

## 02. බුද්ධ දේශනාවේ එන තිරිසන් සතුන් පිළිබඳ ව ඇති තොරතුරු

බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද සද්ධර්මය ඇතුළත් දේශනා පාලිය වනාහි, ලෝක විෂයීය දර්ශනයක් සහිත ය. එම දර්ශනය තුළ පෘථුවියේ අප මසැසට ගෝචර බොහෝ කාරණාවන් හා අප මනසට ගෝචර වන කාරණාවලින් යුක්ත වේ. මසැසට ගෝචර වන්නා වූ

අප අවට පරිසරයේ ඇති සියලු වස්තූන්හි යථා ස්වභාවය විවර කරන අතර, එමගින් උසස් මනසැති මිනිසාට ගත හැකි ප්‍රයෝජනය හුවා දක්වමින් දහම් දෙසීම බුදුරදුන්ගේ එක් දේශනා විලාසයකි.

පරිසරයේ ඇති පෘථුවි, ශාක, සත්ත්ව ප්‍රජාව උපයෝගී කරගෙන ජීවිත යථාර්ථය පසක් කරලන දේශනාවන් ත්‍රිපිටකය පුරාවට දක්නට ඇත. එහි දී 'සත්ත්ව සංකල්පය' පිළිබඳ ව ඉතා පුළුල් දර්ශනයක් බුද්ධ දේශනාවේ සඳහන් වන අතර, සත්ත්වයාගේ උත්පත්තියේ සිට මරණය දක්වාත්, මරණින් මතු ජීවිත පිළිබඳවත් සුපැහැදිලි විස්තරයක් දැක් වේ. පොදුවේ සසරේ ගමන් කරන සියලු ප්‍රාණීන්, 'සත්ත්ව' යන නමින් හඳුන්වා ඇති අතර, තිරිසන් සතුන් ලෙස උපදින්නේ ද මෙම නිරයේ ගමන් කරන මෙම සත්ත්වයා ම බව බුදු දහමේ ඉගැන්වෙයි. තිරිසන් සතුන් ව උපදින්නේ, පෙර අත්බැව්හි අකුසල් රැස් කළ ප්‍රාණීන් ය. අකුසල් රැස් කළ ප්‍රාණීන් එම අකුසල්වල විපාක ලෙස තිරිසන් යෝනියේ උපදින අතර, එය තිරිසන් අපාය ලෙස බුදු දහමේ හඳුන්වා ඇත.

තිරශ්චීනගත සතුන්ගේ අවශ්‍යතා හා චින්තනමය හැකියාව මිනිසාට තරම් නොවුන ද, මිනිසාගේ මූලික අවශ්‍යතා හා සමාන වූ අවශ්‍යතා තිරිසන් සතුන්ට ද ඇත. ආහාර, නින්ද, වාසස්ථාන ආදී කාරණාවන් සතුන්ට ද පොදු වේ. ආහාර සඳහා යැපීම් මාධ්‍ය ලෙස, දඩයම, ශාක, ධාන්‍ය, ගෙඩි වර්ග යොදා ගන්නා අතර, වාසස්ථාන සඳහා බොහෝ දුරට පරිසරයේ සුදුසු ස්ථාන තෝරා ගනියි. ගල්ගුහා, ගුල්, උස් උවදුරුවලින් තොර තැන් සතුන් බොහෝ විට ජීවත් වීම සඳහා යොදා ගන්නා ස්ථානයි. සතුන්ගේ චින්තනමය හැකියාව ප්‍රබල නො වුන ද, ඔවුන්ට කිසියම් උවදුරු අවස්ථාවක දී ක්ෂණික ව වටහාගෙන ඉන් බේරී යැමේ හැකියාව සහජයෙන් ලැබී තිබේ. තිරිසන් සතුන් අතර එකිනෙකාට වෙනස් වූ බාහිර, අභ්‍යන්තර ලක්ෂණයන් දක්නට ඇත. ශරීර ලක්ෂණ හා ගති ලක්ෂණවලින් අන්‍යෝන්‍ය ලෙස වෙනස් වුව ද ඇස්, ඉස්, මස්, ලේ නහරවලින් සැදුම්ලත් ශරීර අභ්‍යන්තරය වෙනස් නො වේ. මෙම ලක්ෂණ හඳුනා ගැනීම සඳහා බුදුරදුන් විසින් දේශනා කරනු ලැබූ කාරණාවන් ඉවහල් වේ.

බුදුරජාණන් වහන්සේ සියලු ලෝක සත්ත්වයාට කරුණා, මෛත්‍රී සහගත කාය, වාග් කර්මවලින් යුක්ත වූහ. එම මෛත්‍රිය තිරිසන් සතුන් කෙරෙහි ද පැවතුණි. සර්පයෙකුට හිංසා කරමින් සිටි දරු පිරිසකට ඉන් වලක්වා එම සර්පයාගේ ජීවිතය රැක දුන් අවස්ථා ද, තමන් වහන්සේ මැරවීමට එවූ රා පොවන ලද නාලාගිරි ඇතු මෛත්‍රීයෙන් දමජය ද, නන්දෝපනන්ද නාරජු දමනය කළ අවස්ථා ද වැනි සිද්ධීන් තුළින් හා උන්වහන්සේ විසින් අනුදැන වදාළ ධම්ම පදයේ, දණ්ඩ වග්ගයේ එන මෙම ගාථා ද්විත්වයෙන් ඒ බව මොනවට පැහැදිලි වේ.

**''සබ්බේ තසන්ති දණ්ඩස්ස- සබ්බේසං ජීවිතං පියං,**

**අත්තානං උපමං කත්වා- න හනෙය්‍ය න ඝාතයේ.''** (ගාථා.130)

'ලොව සියල්ලෝ ම දඬුවමට තැති ගනිති. සියලු දෙනාටම ම ජීවිතය ප්‍රිය ය. එබැවින්, ''තමන්ට මෙන් හැම සතුන්ට ම ජීවිතය ප්‍රිය ය'' යි තමා උපමා කොට සිතා අනුන් නො පෙලන්නේ ය. අනුන් ලවාවත් පීඩා නො කරයි. (ශ්‍රී ශ්‍රීනිවාස මාහිමි, 1962: 132)

**''සුඛ කාමානි භූතානි යො දණ්ඩේන විහිංසති,**
**අත්තනෝ සුඛමෙසානො පෙච්ච සො න ලභතේ සුඛං''** (ගාථා.131)

'යමෙක් තමාට සැප බලාපොරොත්තුවෙන් තමා සේ ම සැප කැමති සත්ත්වයන් දණ්ඩෙන් පෙළා ද හෙතෙම පරලොව දී සැප නො ලබයි.'(එම: 133)

මෙම ගාථාවලින් හෙළි වන කාරණය නම් බුදුරදුන් කිසිදු සත්ත්වයෙකුට හිංසාවීමක් සිදුකිරීමට අනුබල නො දුන් බවයි. එමෙන් ම, සියලු සත්ත්වයන්ට මෛත්‍රිය කිරීමට තම ශ්‍රාවකයන්ට ද අනුදැන වදාරා ඇත. එක් අවස්ථාවක සර්පයෙකු දෂ්ඨ කිරීම නිසා කාලක්‍රියා කළ භික්ෂුවක් මුල්කර ගනිමින් 'ඛන්ධ පිරිත' දේශනා කළ අතර, එහි දී බුදුරදුන් දේශනා කොට වදාළේ එම කාලක්‍රියා කළ භික්ෂුව සර්ප කුලයන්ට මෛත්‍රී නො කළ හෙයින් සර්ප දෂ්ඨ කිරීම හමුවේ අපවත් වූ බවයි.

**''නහ නූන සො භික්ඛවේ චත්තාරි අහිරාජකුලානි මෙත්තේන චිත්තේන ඵරි. සචේ හි සො භික්ඛවේ භික්ඛු චත්තාරි අහිරාජකුලානි මෙත්තේන චිත්තේන ඵරෙය්‍ය. නහි සො භික්ඛවේ භික්ඛු අහිනා දට්ඨෝ කාලං කරෙය්‍ය....''** (ප්‍රේමානන්ද හිමි 2003:48)

එම පිරිත් සූත්‍රයේ ම සතුන්ට මෛත්‍රී කළ යුතු ආකාරය දක්වා තිබේ.

**''මාමං අපාදකො හිංසී- මාමං හිංසි දිපාදකො**
**මාමං චතුප්පදො හිංසී- මාමං හිංසි බහුප්පදො''**(එම: පිටු.53)

එනම්, 'මම පා නැති සතුන්ට ද, දෙපා සතුන්ට ද, සිව්පා සතුන්ට ද, බහු පා සතුන්ට ද හිංසා නොකරමි...........' යනුවෙනි.

මෙයින් ඉස්මතු වන්නේ, බුදුරජාණන් වහන්සේ සියලු සත්ත්වයා කෙරෙහි කරුණා මෛත්‍රී සහගත ව කටයුතු කළ බවයි. එසේ හෙයින්, බුද්ධ දේශනාවේ එන තිරිසන් සතුන් පිළිබඳ ව තොරතුරු තෝරාගත් සතුන් කිහිපදෙනෙකු හරහා විමසා බලමු.

### 02.1. සිංහයා

සිංහයා යනු, සිව්පාවන්ට හා වනයට අධිපති ලෙස හා සිව්පාවන් අතර උසස් සත්ත්වයෙකු ලෙස ද සළකනු ලබයි. සිංහ කුලයන්හි කේශර සිංහයාට ප්‍රබල තුනක් හිමි වේ. සිංහයා පිළිබඳ ව බුදුරදුන් ඉතා උසස් ලෙස ගුණ වර්ණනා කර ඇත. සිංහයා කෙතරම් උසස් ලෙස සළකා ඇත්දැ'යි කිවහොත් තමන් වහන්සේ ද සිංහයාට සමාන කරමින් දේශනාවන් පවත්වා ඇත. එයට හොඳ ම නිදර්ශනයක් ලෙස, සූත්‍ර පිටකයේ සංයුක්ත නිකායේ, ඛන්ධක වග්ගයේ එන, ''සීහෝපම සූත්‍රය'' හැඳින්විය හැකි ය.
එම සූත්‍රයේ සිංහයාගේ ගති ලක්ෂණ බුදුරදුන් විසින් මැනවින් පෙන්වා දී ඇත.
**''සීහෝ භික්ඛවේ, මිග රාජා සායන්හසමයං ආසයා නික්ඛමති, ආසයා නික්ඛමිත්වා විජම්පති, විජම්පිත්වා සමන්තා චතුද්දිසං අනුවිලෝකෙති, සමන්තා චතුද්දිසා අනුවිලොකෙත්වා තික්ඛත්තුං**

**සීහනාදං නදති. තිකඛත්තුං සීහනාදං නදිත්වා ගෝචරාය පක්කමති.''** (බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා[D],1983:147)

මෙහි දී, බුදුරදුන් සිංහයා පිළිබඳ පුළුල් විස්තරයක් සිදුකරයි.

'මෘගරාජ වූ සිංහයා සවස්වරුවේ වාසස්ථානයෙන් නික්මෙයි. වාසයෙන් නික්මැ වැජඹෙයි. වැජඹ හාත්පස සතරදික් පරීක්‍ෂා කොට බලයි. හාත්පස සතරදික් තෙවිටක් බලා තෙවටක් සිංහනාද කරයි. තෙවිටක් සිංහ නාද කොට ගොදුරු පිණිස යයි.' සිංහයා තම ආහාර සඳහා යැමට මත්තෙන් උස් ස්ථානයකට ගොස් වනය පිරික්සීමට ලක්කරයි. ඉන් පසු තුන් වරක් සිංහනාද කොට දඩයමේ යයි. සිංහ නාදයට බිය පැමිණි සතුන් ජීවිත ආරක්‍ෂාව පිණිස සැඟ ව පළා යති. ගම්නියම්ගම් රාජධානිවල දැඩි වරපටින් බැඳ සිටින සිටින හස්තීන් පවා බිය පත් ව මල මූත්‍ර හෙළමින් වරපට කඩාගෙන පලා යති. මෘගරාජ වූ සිංහයා තිරිසන් සතුන් අතරින් මෙබඳු ඍද්ධි ඇති හා මහේශාක්‍ය මහත් ආනුභාව ඇති සත්‍වයෙකු ලෙස බුදුරදුන් හඳුන්වා ඇත. සිංහයාගේ මෙම ලක්‍ෂණය නිසා උසස් සත්‍වයෙකු ලෙස හැඳින්විය හැකි ය.

එම නිසා ම බුදුරදුන් සැතපෙන විලාසය දැක්වෙන්නේ, 'සිංහ සෙය්‍යාව' ලෙස ය. සිංහයාගේ කේශර සිංහනාදය කෙතරම් ප්‍රබල ද යත්, බුදුරදුන්ගේ අසදෘශ බුද්ධ ලීලාව විදහාලනු වස්, දේශිත සූත්‍රයක් වන 'මහා සීහනාද සූත්‍රය' හා සක්විති රජුන් පිළිබඳ දේශිත 'චක්කවත්ති සීහනාද සූත්‍රය' ආදිය නිසා, සිංහයාගේ උසස් බව හොඳින් ම පැහැදිලි වේ.

### 02.2. ඉදිබුවා.

ඉදිබුවා යනු, උභයජීවි සත්‍වයෙකි. ඉබ්බාගේ ශරීරය තිබෙන්නේ, කටුවක් අභ්‍යන්තරයේ ය. එම කටුව ඉබ්බාගේ ආරක්‍ෂාවට අතිශයින් වැදගත් අංගයකි. ඉදිබුවාගේ මෙම ලක්‍ෂණය මුල් කරගනිමින් බුදුරදුන් දේශනා පවත්වා තිබේ. ඒ සංයුක්ත නිකායේ සළායතන වග්ගේ එන 'කුම්මෝපම සූත්‍රය' මේ සඳහා උදාහරණ ලෙස පෙන්වා දිය හැකි ය.

''මහණෙනි, පෙර වූවක් කියමි, ඉදිබුවෙක් සවස් යාමයේ ගං ඉවුර අසබඩ ගොදුරු සොයමින් සිටියේ ය. එහි සිටි ගොදුරු සොයමින් සිටි සිවලෙක් මෙම ඉදිබුවා දැක ඌ ඩැහැ ගැනීමට පැන්නේ ය. ඉදිබුවා තම කටුව තුළට රිංගා ආරක්‍ෂා විය. සිවලා ඉදිබුවා යම් වේලාවක කකුළක් ඉවතට දැම්මොත් සපා කන්නට මාන බලාගෙන සිටියේ ය...............'

**''ඒවමෙව බෝ භිකඛවේ තුම්හෙහි මාරෝ පාපිමා සතතං සමිතං පච්චුපට්ඨිතෝ.....................''** (බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා,[B] 1981:348)

'මහණෙනි, මේ ආකාරයෙන් ම පාපී වූ මාරයා ඔබ දෙස බලා සිටියි......'

බුදුරදුන් ඉදිබුවා මුල් කරගනිමින් භික්‍ෂූන්ට අවවාද දී ඇති ආකාරය මෙම සූත්‍රයෙන් පෙනී යයි.

### 02.3. වඳුරා

වඳුරා පිළිබඳ ව බුද්ධ දේශනාවේ බොහෝ දේශනාවන් සඳහන් ව තිබේ. සංයුක්ත නිකායේ මහා වග්ගයේ එන මක්කට සූත්‍රය සඳහන් වේ. මෙම සූත්‍රයෙන් දඩයම්කරුවන් විසින් වඳුරන් ඇල්ලීම

සඳහා යොදාගන්නා ක්‍රමයක් පිළිබඳ ව සඳහන් කරමින් බුදුරදුන් දේශනා කරන්නේ, මාරයාගේ වසඟයට නොයා ජීවත් විය යුතු ආකාරයයි.

**"..........යෝ පන සෝ මක්කටො බාලජාතකෝ ලෝලජාතකෝ සෝ තං ලෙපං උපසංකමිත්වා හත්ථෙන ගණ්හාති. සෝ තත්ථ බජ්ඣති........"** (බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා[C] ,1982:270)

"යම් වඳුරෙක් බාලගති ඇත්තේ, ලොල්ගති ඇත්තේ වේ නම් හේ ඒ ලාටු කරා එළඹ අතින් ගෙන එහි ඇලේ........."

වඳුරා තෘෂ්ණාවෙන් තොර ව මලපුඬුවට හසු නොවී ජීවිතය බේරා ගන්නා ආකාරය හා තෘෂ්ණාවෙන් යුතු වඳුරා එම මලපුඬුවට හසු ව ජීවිතය විනාශ වන ආකාරය දක්වමින් බුදුරදුන් තෘෂ්ණාවෙන් යුතු සත්වයා තෘෂ්ණාව නිසා ජීවිතය විනාශ වන ආකාරය දක්වයි.

### 02.4. සර්ප

සර්පයා යනු, විෂ සහිත උරග වර්ගයේ සත්වයෙකි. සර්පයාගේ විෂ මුලු කරගනිමින් බුදුරදුන් පැවැත් වූ දේශනයක් ලෙස 'ආසිවිසෝපම සූත්‍රය'(නිදාන වග්ග, වේදනා සංයුත්ත) හැඳින්විය හැකි ය.

**''සෙය්‍යථාපි භික්ඛවේ චත්තාරෝ ආසිවිසා උග්ගතේජා ඝොර විසා, අථ පුරිසෝ ආගච්ඡෙය්‍ය ජීවිතකාමෝ අමරිතුකාමෝ සුඛ කාමෝ දුකඛපටික්කූලෝ..............................''** (බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා[A] , 1983:340)

'මහණෙනි, උග්‍ර විෂ ඇති සර්පයෝ සිව්දෙනෙකු එක් පුරුෂයෙකු විසින් ඉතා අපහසුවෙන් පෝෂණය කරයි........'

මෙහිදී බුදුරදුන් මෙම සර්පයන් ලෙස හඳුන්වා ඇත්තේ, මිනිසෙක් නිර්මාණය වී ඇති, පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූතයෝ ය. මෙම සතර මහා භූතයෝ මිනිසුන් වසඟයට ගෙන ඇති බව වදාරමින් එම වසඟයෙන් මිදීමට නම්, ක්ෂේම භූමිය කරා එළඹිය යුතු බැව් දේශනා කරන ලදී.

### 02.5. සිවලා

සිවලා යනු, සත්ව ලෝකයේ කපටිකමෙන් යුතු සතෙකු ලෙස හැඳින් වේ. සිවලා පිළිබඳ ව බුදුරදුන් දේශනා කර ඇත්තේ, සංයුක්ත නිකායේ, නිදාන වග්ගයේ ය. ලාභ සත්කාරවලට ගිජුවීම අයහපත් බව දක්වමින් මෙම සූත්‍රය දේශනා කර ඇත.

**''අස්සුත්ථ නෝ භික්ඛවේ රත්තියා පච්චූසසමයං ජරසිඟාලස්ස වස්සමානස්සාති? ජරසිඟාලෝ උක්කණ්ඨකෙන නාම රෝග ජාතේන ඵුට්ඨෝ නෙව බිල ගතෝ රමති න රුක්ඛමූල ගතෝ රමති.......''** (බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා,[A] 1981:350)

සිවලාට උක්කණ්ඨක නම් රෝගය වැළඳුණු කල්හි ඌ ජීවත් වන පරිසරය කෙබඳු වුව ද ඌට ඒ තැන නො ම ඇලෙයි. එමෙන් ම ලාභ සත්කාරයේ ඇලුණු පුද්ගලයාට කෙබඳු තැනක් වුව ද නොම ඇලෙයි. සිවලා පිළිබඳ ව මේ දක්වා ඇති කරුණුවලින් පැහැදිලි වන්නේ, සිවලාගේ ගති ලක්ෂණ මෙන් ම රෝග ලක්ෂණ පිළිබඳවත් බුදුරදුන්ට අවබෝධයක් තිබූ බව පෙනේ.

**02.6. බළලා**

බළලා නිවෙස්වල ගැවසෙමින් දඩයම් කරන අතර, බළලාගේ ප්‍රිය ආහාරයක් වන මූෂිකයන් සොයා යෑම බළලාගේ පුරුද්දයි. බුදුරදුන් මෙම කාරණාවන් මුල් කරගෙන සිදුකරන ලද දේශනයක් සංයුක්ත නිකායේ නිදාන වග්ගයේ සඳහන් වේ.

එක් දිනක් දඩයමේ ගිය බළලෙක් මීයෙකු දැක ඌ කෑමේ රිසියෙන් නෙසපා ම ගිල්ලේ ය.

මීයා බළලාගේ බඩ තුළට යන්නේ, බළලාගේ බඩවැල් ආදිය සපා කෑවේය. එ හේතුවෙන් බළලා මිය ගියේ ය.

**''.................අථ ඛෝ භික්ඛවේ මුදුමූසූ ගෝචරාය පක්කමි. තමේනං බිළාලෝ ගහෙත්වා සහසා අසංඛාදිත්වා අජ්ඣෝහාරී. තස්ස මූදුමූසී අන්තම්පි ඛාදි...............................''**

(බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා,[A] 1981:417)

මෙහි දී, බළලාගේ පුරුද්ද නිසා ජීවිතය නැති වූ බව දක්වමින් බුදුරදුන් භික්ෂූන්ට අවවාද කොට ඇත.

**03. නිගමනය**

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර ඇති දේශනා පාළියේ සඳහන් සත්වයන් පිළිබඳ ව තෝරාගත් සූත්‍ර ඛාණ්ඩවලින්, තෝරාගත් සතුන් කිහිපදෙනෙකු පිළිබඳ ව අධ්‍යයනය කිරීම තුළින්, එම සතුන් පිළිබඳ ව බුදුරදුන් විසින් සඳහන් කර ඇති කාරණාවන් හා එම සතුන් බාහිර හා අභ්‍යන්තර ලක්ෂණයන් හඳුනා ගැනීම මෙම නිබන්ධනයේ අරමුණ විය.

සතුන් පිළිබඳව දේශනා කර ඇති සූත්‍ර අධ්‍යයනය කිරීමේ දී පෙනී ගිය කාරණය නම්, එම සතුන්ගේ මූලික ලක්ෂණයන් තුළින් මිනිසාට ජීවිතයට බොහෝ වැදගත් කාරණාවන් රාශියක් ලබා ගත හැකි බවයි. සතුන්ගේ ජීවන ක්‍රමවේදයන් සැකසී ඇත්තේ, පරිසරයට ගැළපෙන ආකාරයෙනි. සිංහයා, බළලා, සිවල් ආදී සතුන් දඩයම මුල් කරගත් ජීවන රටාවක් ඇති අතර, ඒ සතුන් තම ගොදුරු සඳහා යොමු වන ආකාරය මෙන් ම ගොදුරු ගන්නා අවස්ථාවන් වල කටයුතු කරන ආකාරය දක්වා ඇති ආකාරයෙන් පෙනී යන්නේ, බුදුරදුන් තමන් වහන්සේගේ දිව්‍යචක්ෂුසයේ ඇති ප්‍රබලත්වයයි.

සතුන් සියලු දෙනාට ම පොදු වූ ධර්මතාවන් පිළිබඳ ව මෙම අධ්‍යයනයෙන් ප්‍රකට විය. සියලු සත්වයෝ ආහාර පැවැත්ම කොට ඇති බව(සබ්බේ සත්ථා ආහාරට්ඨිථිකා) මින් ගම්‍ය වේ. එමෙන් ම සතුන්ගේ ජීවන රටාව ද මිනිසාගේ මිනිසාගේ මුලික අවශ්‍යතා හා සමාන වන බව පෙනේ.

පුරාවිද්‍යාවේ උපවිෂයක් ක්ෂේත්‍රයක් ලෙස සත්ත්ව පුරාවිද්‍යාවේ (Zoo archaeology) පෙන්වා දිය හැකි ය. පුරාවිද්‍යාත්මක සාධකවලින් සතුන්ගේ අස්ථි, දත් ආදී දෘඪ දේ පමණක් සාධක වශයෙන් අත්පත් කර ගනු ලැබුව ද, ඔවුන්ගේ මරණයන්, ගති ස්වභාවයන්, පැවැත්ම පිළිබඳ සාධක ආදිය පිළිබඳව තොරතුර අත්පත් කර ගැනීම තරමක් අපහසු ය. මානවවංශ

විද්‍යාත්මක අධ්‍යයනයන් ඔස්සේ මේ සඳහා යම් දායකත්වයක් ලබා ගත හැකි අතර, බුද්ධ දේශනාවන් තුළින් ඉහත පරිදි හඳුනා ගනු ලබන නිදර්ශනයන් ද පුරාවිද්‍යාත්මක අධ්‍යයන් සඳහා උපයෝගි කර ගත හැකි වනු ඇත යන්න අපගේ විශ්වාසයයි. ද්‍රව්‍යාත්මක සංස්කෘතිය (Material culture) පෝෂණය කිරීම සඳහා ශාස්ත්‍රීය ගවේෂණය, සාකච්ඡා මෙන් ම ධර්ම කරුණු අධ්‍යයනය ද වඩාත් හිතකර බැව් ඉහත ලිපිය ඔස්සේ පෙන්වා දෙනු කැමැත්තෙමි.

**ආශ්‍රේය මූලාශ්‍ර හා ලිපි නාමාවලිය**

***බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා,[B]*** 1981, සූත්‍රාන්ත පිටකයේ සංයුක්ත නිකායේ චතුර්ථ භාගය, සළායතන වග්ගය, රාජ්‍ය මුද්‍රණාලය.

***බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා,*** 1982[C], සූත්‍රාන්ත පිටකයේ සංයුක්ත නිකායේ පඤ්චම භාගය, මහා වග්ගය, රාජ්‍ය මුද්‍රණාලය.

***බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා,*** 1983[A], සූත්‍රාන්ත පිටකයේ සංයුක්ත නිකායේ ද්විතිය භාගය, නිදාන වග්ගය, රාජ්‍ය මුද්‍රණාලය.

***බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා[D],*** 1983, සූත්‍රාන්ත පිටකයේ සංයුක්ත නිකායේ තෘතීය භාගය, ඛන්ධක වග්ගය, රාජ්‍ය මුද්‍රණාලය.

ධර්මකීර්ති ශ්‍රී ශ්‍රීනිවාස මාහිමි වම්බටුවැවේ, ***ධම්ම පද ප්‍රදීපය,*** 1962.කොළඹ ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

සම්පාදකඃ පේමානන්ද හිමි, වතුවත්තේ, ***පිරුවානා පොත් වහන්සේ,*** 2003, රත්න පොත් ප්‍රකාශකයෝ. කොළඹ.